**වර්ගය:** අනිවාර්ය/වෛකල්පික

**පාඨමාලා සංකේතය :** DMAT E3035

**මාතෘකාව:** ප්‍රායෝගික: නාට්‍ය නිෂ්පාදනය හෝ නිබන්ධය

**ඉගෙනුම් ඵල:** හොඳ පිටපතක් තෝරාගෙන සුදුසු නළුවරණයකින් පසු රංගන ශිල්පීන් යොදවා පෙළ අර්ථකථනය කොට ආනුෂංගික අංග සමග මනාව සංකලනය කොට සාර්ථක නාට්‍යයක් නිෂ්පාදනය කරන්නේ කෙසේ ද යන්න විද්‍යාර්ථියා අවබෝධ කොටගනී.යම් ක්ෂේත්‍රයක් පිළිබඳව පර්යේෂණ කර ශාස්ත්‍රීය නිබන්ධයක් ලියන්නේ කෙසේ ද යන පරිචය ලබා ගනී.

**පාඨමාලා අන්තර්ගතය:**

විෂය නිර්දේශයේ සඳහන් වන නිර්දිෂ්ට නාට්‍ය කෘති අතරින් තෝරාගත් පෙළක් ඇසුරු කරගෙන රංග කාලය විනාඩි 20 - 30 අතර වූ අංකයක්/ජවනිකාවක් නිර්මාණය කොට ඉදිරිපත් කිරීම.නොඑසේ නම් ස්වතන්ත්‍ර පිටපතක් අනුව ඒකාංගික කෙටි නාට්‍යයක් (රංග කාලය විනාඩි 20 - 30 අතර) නිෂ්පාදනය කිරීම.

**ක්‍රමවේදය:** නාට්‍ය රචනය, නිෂ්පාදනය හා අධ්‍යක්ෂණය

**ඇගයීමේ ක්‍රමය:** වර්ෂ අවසානයේ ප්‍රායෝගික පරීක්ෂණ මගින්

**නාට්‍ය නිෂ්පාදනය (ප්‍රායෝගික) සපුරාලිය යුතු අවශ්‍යතා :**

රංග කාලය විනාඩි 20 - 30 අතර විය යුතුය.
අංග රචනා, වේෂ නිරූපණ, නාට්‍යෝපකරණ, පසුතල අලංකරණ නාට්‍යයට උචිත පරිදි යොදාගත යුතුය.
රංගාලෝකය අනිවාර්යය අංගයක් ලෙස නොසැලකේ.
නාට්‍ය නිෂ්පාදනය සුදුසු ස්ථානයක වේදිකාගත කළ යුතුය.

විද්‍යාර්ථියා තමා විසින් රචිත හෝ අනෙකෙකුගේ ස්වතන්ත්‍රපිටපතක් උපයෝගී කර ගන්නේ නම් නිෂ්පාදනයට පෙර පිටපත නාට්‍ය හා රංග කලා අධ්‍යයන ඒකකයට ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතුය.

රංගනයට, අධ්‍යක්ෂණයට දක්ෂතා ඇතැයි අධ්‍යයන අංශය විසින් සෑහීමකට පත්වන විද්‍යාර්ථීන්ට පමණක් නාට්‍ය නිෂ්පාදනය සඳහා අවසර දෙනු ලැබේ.

**නිබන්ධය:** විද්‍යාර්ථියාගේ යෝජනාව පරිදි අධ්‍යයනාංශය විසින් අනුමත කරනු ලබන මාතෘකාවක් යටතේ අදාළ ප්‍රමිතියට අනුකූලව වචන 5000 කට නොඅඩු ශාස්ත්‍රීය නිබන්ධයක් ඉදිරිපත් කළ යුතුය. නිබන්ධ ඇගයීමෙන් අනතුරු ව ඊට අදාළව සිදුකොරෙන වාචික පරීක්ෂණයකට ද පෙනී සිටීමට සිදුවේ.